SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2017 ජූලි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA25)

## ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම
## (BLE)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය


# AA2 විභාගය - 2017 ජූලි
# (AA25) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

# යෝජිත උත්තර

## A කොටස

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**අනිවාර්ය ප්‍රශ්න දහයකි. (10)**

**(මුළු ලකුණු 20)**

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්නය | උත්තරය |
|---|---|
| 1.1 | (3) |
| 1.2 | (4) |
| 1.3 | (1) |
| 1.4 | (4) |
| 1.5 | (4) |
| 1.6 | (2) |
| 1.7 | (1) |
| 1.8 | - අපරාධ සහ සිවිල් නඩුවල අවසාන අභියාචනාධිකරණය ලෙස ක්‍රියා කිරීම (අභියාචනාධිකරණ, දිසා අධිකරණ හෝ අනෙකුත් පළමු අවස්ථා අධිකරණ)<br>- මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කිරීමට ඇති බලය<br>- පාර්ලිමේන්තු වරප්‍රසාද කඩවීම් විභාග කිරීමට ඇති බලය<br>- ජනාධිපතිවරයා විසින් යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් උපදේශාත්මක අධිකරණ බලය<br>- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීමට ඇති බලය<br>- ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමට ඇති බලය |
| 1.9 | - පුද්ගල නීතියක් යනු යම් නිශ්චිත ජනවර්ගයක විවාහය, දික්කසාදය, දේපළ උරුමය, ස්වාමිපුරුෂයාගේ සහ භාර්යාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් යෙදෙන නීතියයි.<br>උදා :- මුස්ලිම් නීතිය<br>ප්‍රාදේශීය නීතියක් යනු නිශ්චිත භූගෝලීය සීමාවක් තුළ ජීවත් වන පුද්ගලයින් සම්බන්ධයෙන් අදාළ වන නීතියයි.<br>උදා :- තේසවලමෙයි නීතිය |
| 1.10 | - ආයෝජන යෝජනාවන් සලකා බැලීම<br>- උපදේශාත්මක සේවාවන් ආයෝජකයන් වෙත සැපයීම<br>- බදු සහ වෙනත් සහන ආයෝජකයන් වෙත පිරිනැමීම |

**(මුළු ලකුණු 20)**

**_A_ කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.
(මුළු ලකුණු 25)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

නියෝජ්‍යත්වය ඇති වන විවිධ ක්‍රම අතරින් එක් ක්‍රමයක් වන්නේ ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් ඇති වන නියෝජ්‍යත්වයයි.
මෙහිදී එක් පාර්ශ්වයක් විසින් තම හැසිරීම මගින් තවත් පාර්ශ්වයක් වෙත විශ්වාසයක් ගොඩනගනු ලබයි. එම විශ්වාසය මත කටයුතු කරන එකී තවත් පාර්ශ්වය යම් ක්‍රියාවක් සිදු කරනු ලබයි. එසේ එම ක්‍රියාව සිදු කරනු ලැබීමෙන් පසුව ඔහු විසින් විශ්වාස කළ කරුණු අසත්‍ය බව පැවසීමට විශ්වාසය ඇති කළ පාර්ශ්වයට නීතියෙන් ඉඩ නොදෙයි. මෙය ප්‍රතිබන්ධනය ලෙස හඳුන්වනු ලබයි.
ගැටලුව අනුව AB සමාගමේ කොටස් හිමියන් සහ අධ්‍යක්‍ෂවරුන් වන අමල් සහ බිමල් විසින් Land Developers සමාගම වෙත හේමාල්ව අධ්‍යක්‍ෂවරයෙකු ලෙස හඳුන්වා දී ඇත. එකී කරුණු කෙරෙහි විශ්වාසය තබන Land Developers සමාගම විසින් හේමාල් මගින් සමාගම සමග ගිවිසුමකට ඇතුළත්ව ඇත.
මෙසේ ගිවිසුමට ඇතුළු වීමෙන් පසුව හේමාල්ට තමා වෙනුවෙන් ගිවිසුමකට එළඹීමට බලයක් නොමැති බව පැවසීමට AB සමාගමට හැකියාවක් නොමැත. AB සමාගම විසින් Land Developers සමාගම වෙත ඇති කළ විශ්වාසයෙන් වගකීමට බැඳේ.
මන්ද මෙහිදී AB සමාගම ප්‍රධානියා ලෙස ද, හේමාල් නියෝජිතයා ලෙස ද නියෝජ්‍යත්වයක් නිර්මාණය වේ. මේ අනුව හේමාල් විසින් ඇති කරගත් ගිවිසුමෙන් AB සමාගම ප්‍රධානියා ලෙස වගකීමට බැඳේ.

*(ලකුණු 05)*

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

මෙහිදී අප විසින් සලකා බැලිය යුතු කරුණු දෙකක් ඇත.

1. **ගනුදෙනු කළ නොහැක යනුවෙන් කර ඇති රේඛනය**
   මෙම රේඛනය මගින් ඇති වන එකම ප්‍රතිඵලය වන්නේ ධාරක යථා කාල ධාරකයෙකු වීම වැළැක්වීමයි. ඒ අනුව මේ සම්බන්ධයෙන් බැංකුව වෙත කිසිදු වගකීමක් නොමැත.

2. **අත්සන අපැහැදිලි වීම සහ අකුරෙන් සහ ඉලක්කමෙන් දක්වා ඇති වටිනාකම එකිනෙකට පරස්පර වීම**
   මේ හේතුවෙන් මෙම චෙක්පත මතුපිටින් පෙනෙන පරිදි අවිධිමත් චෙක්පතක් බවට හඳුනාගත හැකිය. ඒ අනුව අණලාභී බැංකුව විසින් මෙම චෙක්පතට මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කළ යුතුය. මෙවැනි චෙක්පතක් සඳහා අණලාභී බැංකුව විසින් මුදල් ගෙවනු ලැබුවහොත් එකී බැංකුව විසින් ඒ සම්බන්ධයෙන් සිදුවන අලාභ සඳහා වගකීමට බැඳේ.

3. ගිණුමේ ඇති අරමුදල් ප්‍රමාණවත් නොවීම.

*(ලකුණු 05)*

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) - විනිමය බිල්පත් (Bills of exchange)
   - ලේඛන ලැබීම මත ගෙවීම (Collection agreement)

- ණයවර ලිපි (Letter of Credit)
- ගිණුම විවෘත කිරීම මත ගෙවීම් (Payment on open accounts)
- ඉදිරි ගෙවීම් (Payment in advance)
- විද්‍යුත් වාණිජ්‍යය (Electronic Commerce)

b) **විනිමය බිල්පත්**

මෙහිදී විකුණුම්කරු විසින් ගැනුම්කරු වෙත විනිමය බිලක් අණකර ගැනුම්කරුගේ ප්‍රතිග්‍රහණය ලබා ගනී. ප්‍රතිග්‍රහණයෙන් පසුව ගැනුම්කරු බිල මත වගකීමට බැඳේ. පසුව විකුණුම්කරුට බිල බැංකුව වෙත ඉදිරිපත් කර වට්ටම් කර මුදල් ලබාගත හැකිය.

**ලේඛන ලැබීම මත ගෙවීම**

මෙහිදී විකුණුම්කරු විකුණුම්කරුග් බැංකුව වෙත නැව්ගත කිරීමේ ලේඛනය ලබා දේ.
පසුව විකුණුම්කරුගේ බැංකුව එම ලේඛන ගැනුම්කරුගේ බැංකුව වෙත ලබා දෙයි.
ගැනුම්කරුගේ බැංකුව නෞභාර පත්‍රය ගැනුම්කරු වෙත ඉදිරිපත් කර එය ප්‍රතිග්‍රහණය කරවා ගැනීමෙන් පසුව නෞභාර පත්‍රයේ මුල් පිටපත ගැනුම්කරුට ලබාගැනීමට අවශ්‍ය නැව්ගත කිරීමේ ලේඛන ගැනුම්කරුට ලබාදෙයි. පසුව නෞභාර පත්‍රයේ මුල් පිටපත නැවට භාර දී ගැනුම්කරුට භාණ්ඩ ලබාගත හැකිය.

**ණයවර ලිපි**

මෙහිදී විකුණුම්කරු සහ ගැනුම්කරු අතර භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇති කරගැනීමෙන් පසුව ගැනුම්කරු විසින් තම බැංකුව වෙත විකුණුම්කරු වෙනුවෙන් විකුණුම්කරුගේ බැංකුවේ ණයවරයක් විවෘත කරන ලෙස ඉල්ලා සිටියි.
මෙහිදී විකුණුම්කරුට මුදල් ගෙවීම සඳහා විකුණුම්කරු විසින් ගැනුම්කරුට ලබාදිය යුතු ලේඛන මොනවාද යන්න ගැනුම්කරු සඳහන් කරනු ලබයි.
පසුව විකුණුම්කරු විසින් අදාළ ලේඛන විකුණුම්කරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර විකුණුම්කරුගේ බැංකුව විසින් ගැනුම්කරුට මුදල් ගෙවනු ලබයි.
ගැනුම්කරුගේ බැංකුව විකුණුම්කරුගේ බැංකුවට මුදල් ගෙවනු ලබන අතර විකුණුම්කරුගේ බැංකුව විසින් ගැනුම්කරුගේ බැංකුව වෙත අදාළ ලේඛන ලබාදීම සිදු වේ.

**ගිණුම් විවෘත කිරීම මත ගෙවීම**

මෙහිදී විකුණුම්කරු භාණ්ඩ හා නැව්ගත කිරීමේ ලේඛන ඇතුළු සියල්ල ගැනුම්කරුට යවනු ලබන අතර අනාගත දිනකදී මුදල් ගෙවීමට ගැනුම්කරු පොරොන්දු වේ.

**ඉදිරි ගෙවීම්**

විකුණුම්කරු විසින් භාණ්ඩ භාරදීමට පෙර ගැනුම්කරු විසින් භාණ්ඩ සඳහා මුදල් ගෙවීම මෙහිදී සිදුවේ.

**විද්‍යුත් වාණිජ්‍යය**

අන්තර්ජාලය උපයෝගී කරගනිමින් එය හරහා භාණ්ඩ ඇණවුම් කිරීම සහ ඒ සඳහා මුදල් ගෙවීම මෙහිදී සිදුවේ.

***(ලකුණු 05)***

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

රක්ෂණය යනු උපරිම විශ්වාසය මත පදනම් වන ගිවිසුම් විශේෂයකි.
උපරිම විශ්වාසය යනු ගිවිසුමේ දෙපාර්ශ්වය විසින් හෙළිදරව් කළ යුතු වැදගත් කරුණු එකිනෙකා වෙත හෙළිදරව් කිරීම මත ඇති කරගනු ලබන විශ්වාසයයි.
රක්ෂකයා වෙත හෙළිදරව් කළ යුතු වැදගත් කරුණු වශයෙන් සැලකෙන්නේ රක්ෂකයා විසින් අදාළ රක්ෂණ අවදානම භාරගන්නේ ද නැද්ද යන්න සහ අවදානම භාරගනු ලබන්නේ නම් කුමන වාරිකයක් යටතේ ද යන්න තීරණය කිරීම සඳහා වැදගත් තොරතුරුය.
උදා- ජීවිත රක්ෂණයක් ලබාගැනීමේදී ඉල්ලුම්කරු දියවැඩියා රෝගයෙන් පෙළේ ද යන්න වැදගත් කරුණකි. නමුත් ඉදහිට ඇතිවන හිසරදය නොවැදගත් කරුණකි.
උපරිම විශ්වාසය පිළිබඳ යුතුකම රක්ෂිතයා විසින් කඩකරනු ලැබුවහොත් අදාළ ගිවිසුම අවසන් කිරීමට සහ වන්දි හිමිකම් නොගෙවා සිටීමට රක්ෂකයාට හැකියාවක් ඇත.
**ලුකර් එරෙහිව ලෝ යූනියන් රක්ෂණ සමාගම් නඩු තීන්දුව**
මෙම නඩුවේදී ඉල්ලුම්කරු දරුණු ලෙස නියුමෝනියා රෝගයෙන් කලින් පෙළුණු බව හෙළිදරව් නොකළේය. ඉල්ලුම්කරු උපරිම විශ්වාසය පිළිබඳ යුතුකම කඩ කර ඇති බව අධිකරණය තීරණය කරන ලදී.
ගැටලුව අනුව දෙපාර්ශ්වය අතර ඇති ගිවිසුමේ එකී උපරිම විශ්වාසය පිළිබඳ යුතුකම බිංදු විසින් කඩ කර ඇති බව පෙනී යයි. ඒ අනුව බිංදුගේ රක්ෂණ හිමිකම් පෑම ප්‍රතික්ෂේප කිරීමට රක්ෂණ සමාගමට හැකියාව ඇත.

*(ලකුණු 05)*

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a)
- සේවා ස්ථානය තුළ ඵලදායී සහ ප්‍රසිද්ධ පැමිණිලි ඉදිරිපත් කිරීමේ පද්ධතියක් අන්තර්ගත කිරීම
- ආචාරධර්මානුකූල හැසිරීම්, උල්ලංඝනය කිරීම් පිළිබඳ වාර්තා කිරීමට, ඉතා පැහැදිලි සඳහන් කළ වගකීමක් පැවතීම
- අධීක්ෂණය සඳහා පිළිවෙත් සහ ක්‍රියාපටිපාටි තිබීම
- ආයතනයේ කළමනාකාරිත්වය මූලික මූලධර්මයන්ට අනුකූල වීමේ වැදගත්කම නිරන්තරයෙන්ම අවධාරණය කිරීම

b)
- සාංගමික යහපාලන පිළිබඳ රෙගුලාසි
- වෘත්තීමය ප්‍රමිතීන්
- වෘත්තියට පිවිසීමේදී, පවතින අධ්‍යාපනික, පුහුණු සහ අත්දැකීම් පිළිබඳව වන අවශ්‍යතාවන්
- වෘත්තිය සංවර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම පිළිබඳව වන අවශ්‍යතාවන්
- වෘත්තිමය හෝ රෙගුලාසිමය අධීක්ෂණය කිරීම් සහ විනයානුකූල කාර්ය පටිපාටීන්
- වෘත්තීමය ගණකාධිකාරීවරයෙකු සපයන වාර්තා හෝ තොරතුරු, නෛතික බලය ලද බාහිර තුන්වන පාර්ශ්වයක් විසින් සමාලෝචනයට ලක් කිරීම

*(ලකුණු 05)*

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

තෝරතයක් යනු යම් පුද්ගලයෙකුගේ ශරීරයකට, කීර්තියකට හෝ දේපළකට අලාභහානි සිදු කිරීමයි. අලාභ සිදු වූ පාර්ශ්වයට වන්දි ඉල්ලා සිටිය හැක.

හවුල් ව්‍යාපාර පනතේ 10 වන වගන්තිය අනුව හවුල්කරුවෙක් තම එදිනෙදා සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී සිදු කළ ක්‍රියාවකින් යමෙකුට අලාභ සිදු වූ විට සියලු හවුල්කරුවන් සාමූහිකව ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳේ. එමනිසා අගතියට පත් පාර්ශ්වයට සියලු හවුල්කරුවන්ට එරෙහිව නඩු පැවරිය හැක.

*Hamiyn v. Houston and Co.* නඩුවේදී හවුල්කරුවෙකු තරගකාරී ව්‍යාපාරයක තොරතුරු ලබාගැනීමට අල්ලසක් දෙන ලදී. එම ව්‍යාපාරය හවුල්කරුවන්ට එරෙහිව නඩු පවරන ලදී. අධිකරණය තීරණය කරන ලද්දේ තම බල සීමාව තුළ සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරේ හවුල්කරුවෙකු සිදු කළ වැරදි ක්‍රියා සඳහා හවුල්කරුවන් සාමූහිකව වගකීමට බැඳෙන බවයි.

අනෙක් අතට හවුල්කරුවන් හවුල් ව්‍යාපාරයේ එදිනෙදා ව්‍යාපාරික කටයුතුවල දී එකිනෙකාගේ නියෝජිතයන් ලෙස සැලකේ. එමනිසා එක් හවුල්කරුවෙකුගේ එවැනි ක්‍රියාවකින් අනෙක් හවුල්කරුවන් ප්‍රධානියා ලෙස වගකීමට බැඳේ.

ඒ අනුව මෙම හවුල්කරුගේ ක්‍රියාව සම්බන්ධයෙන් අනෙකුත් හවුල්කරුවන් වගකීමට බැඳේ. එමනිසා XYZ සමාගමට ABC හවුල් ව්‍යාපාරයේ සියලුම හවුල්කරුවන්ට එරෙහිව නඩු පැවරීම සිදු කළ හැක.

*(ලකුණු 10)*

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) ප්‍රකාශන අයිතිය යන්නට,
පරිගණක වැඩසටහන්, ලේඛන, කථනයන්, දේශන, සංගීතමය වැඩසටහන්, audio visual වැඩසටහන්, ගෘහ නිර්මාණ ශිල්පය යනාදිය ඇතුළත් වේ.

b) බුද්ධිමය දේපළ පනත අනුව ප්‍රකාශන අයිතියේ ආර්ථික අයිතිවාසිකම් අදාළ ප්‍රකාශන අයිතිකරුගේ ජීවිත කාලය තුළ දී සහ ඔහුගේ මරණින් පසු තවත් අවුරුදු 70 ක් යනතෙක් ආරක්ෂා වේ. මේ අනුව නන්දනගේ උරුමකරුවන්ට රංගට එරෙහිව නඩු පැවරීමට හැකියාව ඇත.

*(ලකුණු 10)*

## 9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) විමල්ට සේවක අර්ථසාධක අරමුදලින් මුදල් ලබාගත නොහැකිය. මන්ද, ඔහුට මුදල් ලබාගැනීමට හැකි වන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව වන බැවිනි.

(b) මාලනීට සේවක අර්ථසාධක අරමුදලින් මුදල් ලබාගත හැකිය. මන්ද, ඇය විවාහය අපේක්ෂාවෙන් රැකියාවෙන් ඉවත් වී ඇති බැවිනි.

(c) ආශාට සේවක අර්ථසාධක අරමුදලින් මුදල් ලබාගත නොහැකිය. මන්ද, ඇය ස්ථිර ලෙස ලංකාව අතහැර නොයන බැවිනි. ඇගේ පත්වීම කොන්ත්‍රාත් පදනම මත ලබා දී ඇති බැවින් ඇය නැවත ලංකාවට පැමිණීමට ද ඉඩ ප්‍රස්ථා තිබේ. එමනිසා රියෝ ලංකා පොදු සමාගමෙන් ඉල්ලා අස්වන අවස්ථාවේ ආශාට ඇයගේ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ආපසු ලබාගත නොහැක.

*(ලකුණු 10)*

***C* කොටසෙහි අවසානය.**

## D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a)

i. දෙපාර්ශ්වයක් අතර වලංගු ගිවිසුමක් ඇති වීම සඳහා ඔවුන් එම ගිවිසුමට ඇතුළත් වන මොහොතේ දී මෙම ගිවිසුම තුළින් නෛතික සම්බන්ධතා ඇති කරගැනීම සඳහා වූ බරපතළ චේතනාවක් පැවතිය යුතුය.

මින් අදහස් වන්නේ යම් පාර්ශ්වයක් අදාළ ගිවිසුම යටතේ තම වගකීම ඉටු කිරීම පැහැර හැරීම සිදුකළහොත් අහිංසක පාර්ශ්වයට අධිකරණය වෙත ගොස් කිසියම් හෝ සහනයක් ලබාගැනීමට ඇති චේතනාව, ගිවිසුමට ඇතුළත් වන මොහොතේ දී පැවතිය යුතු බවයි.

මේ අනුව යම් ගිවිසුමක් ගෘහස්ත ගිවිසුමක් වන්නේ නම් එනම්, කිට්ටු ඥාතීන් මිතුරන් අතර ඇති කරගනු ලැබූ ගිවිසුමක් නම් ගිවිසුම් නීතිය පූර්ව නිගමනය කරනු ලබන්නේ එම පාර්ශ්වකරුවන් අතර මෙම නෛතික සම්බන්ධතා ඇති කරගැනීම සඳහා වූ බරපතළ චේතනාව යන්න ගිවිසුමට ඇතුළත් වන මොහොතේ දී ඔවුන් අතර නොපැවති බවටය.

කෙසේ නමුත් මෙම පූර්ව නිගමනය, බිඳහෙළිය හැකි පූර්ව නිගමනයකි. එනම්, යම් පාර්ශ්වයක් ඇතුළත්ව ඇති ගිවිසුම ගෘහස්ත ගිවිසුමක් වුව ද තමා මෙම ගිවිසුමට ඇතුළත් වන මොහොතේ දී මෙම ගිවිසුම තුළින් නෛතික සම්බන්ධතා ඇති කරගැනීම සඳහා බරපතළ වූ චේතනාවක් පැවති බව සාක්ෂි මගින් අධිකරණය සෑහීමකට පත් කරයි නම්, එවිට ඉහත කී ගෘහස්ත ගිවිසුම්වලට අදාළව යෙදෙන පූර්ව නිගමන බිඳ වැටී වලංගු ගිවිසුමක් ඇති වීම සඳහා අවශ්‍ය මූලික අංගයක් වන නෛතික සම්බන්ධතා ඇති කරගැනීම සඳහා වූ බරපතළ වූ චේතනාව සංස්ථාපනය වේ. ඒ අනුව ඔවුන් අතර වලංගු ගිවිසුමක් හටගනී. ඒ බව *Merrit Vs Merrit* නඩුවේ තීරණය කර ඇත.

ඒ අනුව දී ඇති ගැටලුව අනුව ද, පාර්ශ්වයන්ගේ හැසිරීම අනුව ද ඔවුන් අතර නෛතික සම්බන්ධතා ඇති කරගැනීම සඳහා වූ බරපතළ වූ චේතනාවක් පැවති බව පෙනී යයි. ඒ අනුව ඉහත කී පූර්ව නිගමනය බිඳ වැටී අමල් සහ අමාලි අතර වලංගු ගිවිසුමක් හටගෙන ඇති බව ප්‍රකාශ කළ හැකිය.

ලංකාවේ ගිවිසුම් නීතිය සම්බන්ධයෙන් රෝම ලන්දේසි නීතිය අදාළ වේ. රෝම ලන්දේසි නීතිය අනුව වලංගු ගිවිසුමක් සඳහා සාධාරණ හේතුවක් පැවතිය යුතුය. සාධාරණ හේතුව යන්නට අගනා ප්‍රතිෂ්ඨාවක් හෝ සදාචාරාත්මක බැඳීමක් ප්‍රමාණවත් වේ.

තවද අගනා ප්‍රතිෂ්ඨාව යන්නට පොරොන්දුදායීට ලැබෙන වාසිය හෝ පොරොන්දුලාභීට සිදුවන අගතිය යන්න ඇතුළත් වේ. මේ අනුව පවුල රැකබලා ගැනීම යන්න ගිවිසුම සඳහා හොඳ ප්‍රතිෂ්ඨාවකි.

සදාචාරාත්මක බැඳීම යන්නට ආදරය, දයාව, කරුණාව වැනි ගුණාංග ඇතුළත් වන අතර ඒවා ද ගිවිසුම සඳහා හොඳ ප්‍රතිෂ්ඨාවන් ලෙස සැලකේ.

ii. වෙළෙඳසැලක ප්‍රදර්ශන කවුළුවේ ප්‍රදර්ශනය සඳහා තබා ඇති භාණ්ඩ සැලකිය යුතු වන්නේ ආරාධනාවක් ලෙසටය. (*Fisher Vs Bell, Bootcash Chemist Vs GBPS*) වෙළෙඳසැලට ඇතුළු වන පාරිභෝගිකයා මුදල් ලබා දී එම භාණ්ඩ ඉල්ලා සිටීම අර්පණය ලෙස සැලකේ.

එම අර්පණය පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සාප්පු හිමියාට හැකියාව ඇත.

සාප්පු හිමියා විසින් මුදල් භාර ගෙන භාණ්ඩ නිකුත් කිරීම ප්‍රතිග්‍රහණය ලෙස හඳුන්වනු ලබයි. එවිට දෙපාර්ශ්වය අතර වලංගු ගිවිසුමක් හටගනී.

නමුත් දී ඇති ගැටලුව අනුව අමාලි විසින් අදාළ භාණ්ඩ අතට ගෙන මිල විමසීම ප්‍රතිග්‍රහණයක් නොවන අතර එය අර්පණයකි. එම අර්පණය සාප්පු හිමියා විසින් ප්‍රතිග්‍රහණය කර නොමැත. එමනිසා වලංගු ගිවිසුමක් පාර්ශ්වකරුවන් අතර හටගෙන නොමැත.

b) 1. මෙය භාණ්ඩ විකිණීම සඳහා වූ ගිවිසුමකි.

2. භාණ්ඩ විකිණීමේ ආඥාපනත අනුව, භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ගැනුම්කරුට අයිතිවාසිකම් හා යුතුකම් තිබේ.

3. මෙම සිද්ධි දාමයෙහි විකුණුම්කරු පහත සඳහන් කොන්දේසි කඩ කර තිබේ.

   i. විකුණුම්කරුට විකිණීම සඳහා අයිතියක් තිබේය යන ව්‍යංග කොන්දේසිය. භා.වි.ආ. 13 (a) වගන්තිය (*Rowland Vs Diwalla*) සොරෙකුගෙන් මෝටර් රථයක් මිලදී ගැනීම පිළිබඳ නඩුව)

   ii. විස්තරය සම්බන්ධයෙන් ව්‍යංග කොන්දේසිය පෙරේරා විසින් කඩ කර ඇත. විස්තරය අනුව භාණ්ඩ විකිණීමේ ගිවිසුමක දී භාණ්ඩය විස්තරයට ගැළපිය යුතුය. (*Beale Vs. Taylor*)

   iii. පෙරේරා විසින් වෙළෙඳමය ගුණය පිළිබඳ කොන්දේසිය කඩ කර ඇත. එය සාමාන්‍යයෙන් භාවිත කරන අරමුණට සුදුසු නැත. මෝටර් රථය ධාවනය කරවිය නොහැකි නිසා වෙළෙඳමය ගුණය කඩ වී තිබේ. එය කැඩී ඇති නිසා ආරක්ෂිත නොවන අතර කල්පවතින්නේ නැත.

   එහෙත්, මෙම තත්ත්වයේ දී අලුත්වැඩියාකරු කියන ආකාරයට සිල්වා එය මිලදී ගැනීමට පෙර පරීක්ෂා කර බලා නැත. ඔහුට එය කිරීමට අවස්ථාව තිබුණේ නම්, ඔහු එය කළ යුතුව තිබුණි. ඔහු මිලදීගත් අවස්ථාවේ ම එය රැගෙන ගිය නිසා ඔහුට පරීක්ෂා කිරීමට අවස්ථාව තිබූ බව ද, මෝටර් රථයේ අඩුපාඩු දැකගැනීමට ඉඩ තිබූ බව ද පැහැදිලිය. එමනිසා මෙම ව්‍යංග කොන්දේසිය කඩවීම පෙරේරාට බලපාන්නේ නැත.

4. 13 (b) වගන්තිය අනුව, ගැනුම්කරුට නිර්බාධිතව භුක්ති විඳීමේ හැකියාව ගැන වූ ව්‍යංග ප්‍රතිඥාභාරය කඩ කිරීම හඳුනා දක්වා තිබේ නම්, අතිරේක ලකුණු (points) ලබාදිය හැකිය. විකුණුම්කරු විසින් ව්‍යංග කොන්දේසි කඩකිරීම හේතුවෙන් ගැනුම්කරුවකු ලෙස සිල්වාට පහත සඳහන් ප්‍රතිකර්ම තිබේ.

   1. එලෙසම ඉටු කිරීම - ගිවිසුම නිශ්චිත භාණ්ඩ භාරදීමකට නම් උසාවියට හැඟී යන පරිදි ගිවිසුම නිශ්චිත ලෙස ඉටු කිරීමට නියෝග කළ හැකිය. වන්දි ගෙවා භාණ්ඩ රඳවා ගැනීමේ විකල්පයට ඉඩ නොතබමිනි.

   2. මිල අය කරගැනීම - ගැනුම්කරු මිල ගෙවා තිබේනම් ද, භාණ්ඩ බාරදී නොමැත්තේ නම් හෝ ගැනුම්කරු ඔහුට අයිති නැති භාණ්ඩවලට ගෙවා තිබේ නම්, ගෙවන ලද මුදල ඔහුට අය කරගත හැකිය.

3. කොන්දේසි කඩ කිරීම සඳහා - කොන්දේසි කඩ කිරීම මත ගැනුම්කරුට භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීමට හිමිකම ඇත. එහෙත්, සිල්වා දැනටමත් භාණ්ඩ බාරගෙන ඇත. මෙහිදී, කොන්දේසි කැඩීම සැලකිය හැක්කේ ප්‍රතිඥාභාර කැඩීමක් ලෙස වන අතර, ගැනුම්කරුට, වන්දි ඉල්ලා සිටීම පමණක් කළ හැකි අතර, ඔහුට භාණ්ඩ ප්‍රතික්ෂේප කළ නොහැකිය.

4. ප්‍රතිඥාභාර කැඩීම සඳහා

ගැනුම්කරුට,

i. මිල අඩු කිරීම සඳහා විකුණුම්කරුට එරෙහිව ප්‍රතිඥාභාර කැඩී යැයි නඩු පැවරීම

**හෝ**

ii. ප්‍රතිඥාභාර කැඩී යැයි විකුණුම්කරුට එරෙහිව නඩු පවරා වන්දි ඉල්ලා සිටිය හැකිය. මෙහිදී වන්දිය වන්නේ, ප්‍රතිඥාභාර කැඩීම සම්බන්ධව සාමාන්‍ය සිද්ධි දාමයක් ලෙස කෙලින්ම හා ස්වාභාවික වශයෙන් ඇස්තමේන්තු කරනු ලබන වන්දි මුදලය.

***(මුළු ලකුණු 25)***

***D* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2017 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*